&றுஹூ_டு {றுஞுாஒணுா உ` ூாறுா
All Rights Reserved

## පළමු වාර පරීක්ෂණය 2015

# බුද්ධ ධර්මය - I

**10 ශ්‍රේණිය** **කාලය පැය 1 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **වඩාත් ම නිවැරදි පිළිතුර තෝරන්න.**

01 රාජකීය පවුලකට අදාළ සැපසම්පත් හා ආරක්ෂාව මැද වැඩුණු සිදුහත් බෝසතාණෝ රජකුමරකුට අවශ්‍ය ශිල්ප පිළිබඳ විශේෂ පුහුණුවක් ලැබූහ. සිදුහත් කුමරා ශිල්ප ශාස්ත්‍ර ඉගෙනගත්තේ,

(1) කොණ්ඩඤ්ඤ බමුණු පඬිවරයාගෙනි. (2) සර්වමිත්‍ර බමුණු පඬිවරයාගෙනි.

(3) සෝණදණ්ඩ බමුණු පඬිවරයාගෙනි. (4) චංකී බමුණු පඬිවරයාගෙනි.

02 බෝසත් උපත සිදු වූ විගස වෙනත් කිසිදු උපතක දක්නට නොලැබුණ ආශ්චර්යමත් සිදුවීම වූයේ,

(1) අධික වැස්සක් ඇතිවීම. (2) දැඩි නියඟයක් ඇතිවීම.

(3) සත් පියුම් පිපීම. (4) පොළව කම්පා වීම.

03 සිදුහත් කුමරුගේ ළමා අවධියේ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණයක් වූයේ,

(1) මුහුකුරා ගිය බව(2) හැඩිදැඩි බව

(3) දරදඬු බව (4) උගන්වන දෙය හොඳින් ධාරණය කර ගැනීම

04 සුදොවුන් රජතුමාගේ එකම සිහිනය වූයේ තම පුතා

(1) තමාගෙන් පසු රජවනු දැකීමය. (2) බුදුවනු දැකීමය.

(3) සක්විති රජ කෙනෙකු වනු දැකීමය. (4) අධිරාජ්‍යයකු වනු දැකීමය.

05 තම මව කළුරිය කිරීම නිසා සත්‍ය ලෙසම සැබෑ මව් සෙනෙහස සිදුහත් කුමරුට අහිමි වුව ද එතුමා ඒ ගැනම සිතමින් කාලය ගත නොකළහ. එතුමාට මව් සෙනෙහස අහිමි වූයේ තම උපත සිදුවී

(1) සත් දිනකිනි. (2) සති සතියකිනි. (3) සත් මසකිනි. (4) සත් අවුරුද්දකිනි.

06 සුදොවුන් රජතුමා රජ කුමරකු ලෙස තම පුතුට උසස් කාමභෝගී ජීවිතයක් ගෙවීම සඳහා ගිම්හාන, හේමන්ත, වස්සාන යන ඍතු තුනට අනුරූප වන පරිදි මාලිගා තුනක් කරවා දුනි. ඉන් හේමන්ත ඍතුවට ගැළපෙන මාලිගාව වූයේ,

(1) සුභ මාලිගයයි. (2) රම්‍ය මාලිගයයි.

(3) සුරම්‍ය මාලිගයයි. (4) අති රම්‍ය මාලිගයයි.

07 රජ උයනට යාම ප්‍රිය කළ කුමරුට අතරමගදී සතර පෙරනිමිති දක්නට ලැබුණි. එයින් ප්‍රබල මානසික ගැටළුවක් ඇතිවිය. එතුමා සතර පෙර නිමිති මගින් පසක් කර ගත්තේ

(1) රූප, වේදනා, සඤ්ඤා, සංඛාරා, විඤ්ඤාණ යන ස්කන්ධ පහයි.

(2) මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යන සිවු බඹ විහරණයයි.

(3) රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ ධම්ම යන අරමුණු හයයි.

(4) ජාති, ජරා, ව්‍යාධි, මරණ යන දුක පිළිබඳ ගැටළුවයි.

08 නිබ්බුත ලද තුළින් කියවුණු ''මෙවන් පුතකු ලද මවක්, පියෙක් නිවුණෝ වෙති'' යන්න බොහෝ පුතුන්ගෙන් දෙමාපියනට නොලැබෙන ගෞරවයකි. නිබ්බුත පද කීවේ,

(1) කිසාගෝතමියයි. (2) මාගන්දියා බැමිණියයි.

(3) චිංචිමානවිකාවයි. (4) මල්ලිකා බිසවයි.

09 සක්විති රජකමද, යසෝදරාව ද, පුත් කුමරු ද, බොහෝ සැප සම්පත් ද අත්හැරීම කුමරුට මුහුණ දීමට සිදුවූ

(1) සතුටකි. (2) දුකකි. (3) අභියෝගයකි. (4) නොපැතූ දෙයකි.

10 බෝසත් සිරිත සැබෑ ලෙසම අභියෝග රැසකින් පිරී පැවතුනි. ඒ සියල්ල කුමරු ජයගනු ලැබුවේ

(1) පියා මුල්කොටගෙනය. (2) ඥාතීන් මුල්කොටගෙනය.

(3) මිතුරන් මුල්කොටගෙනය. (4) ඉවසීම, කැපවීම, අධිෂ්ඨානය මුල්කොටගෙනය.

11 බුදුන්වහන්සේ විසින් සිය ශ්‍රාවකයන් හඳුන්වන ලද්දේ

(1) භික්ඛු යන නමිනි. (2) භන්තෙ යන නමිනි.

(3) ආයුෂ්මතුනි යන නමිනි. (4) අර්හත් යන නමිනි.

12 සංසාරගත දුකින් මිදී නිවන් පසක්කර ගනු පිණිස මිනිසාට මග පෙන්වනු ලබන්නේ

(1) පාලකයන් විසිනි. (2) හිතවතුන් විසිනි.

(3) මහා සංඝරත්නය විසිනි. (4) ඥාතීන් විසිනි.

13 ආර්ය ශ්‍රාවක භික්ෂු සමූහය ඇතුළත් සමාජය සංඝ සමාජය හෙවත් භික්ෂු සමාජයයි. එය ඇරඹුනේ

(1) සැරියුත් මුගලන් දෙනමගේ මහණවීමත් සමගය.

(2) පස්වග තවුසන් මහණවීමත් සමගය.

(3) භද්දවග්ගිය කුමාරවරුන්ගේ මහණවීමත් සමගය.

(4) යසකුල පුත්‍රයා ඇතුළු යහළුවන්ගේ මහණවීමත් සමගය.

14 දැනට ලොව පවතින පැරණිම පැවිදි සංවිධානය

(1) ජෛන සමාජයයි. (2) තාපස සමාජයයි.

(3) ආජීවක සමාජයයි. (4) භික්ෂු සමාජයයි.

15 ගැබිණි මාතාවන්ට ආශිර්වාද කිරීම සඳහා දේශනා කරනු ලබන පිරිත් දේශනය වන්නේ,

(1) රතන සූත්‍ර පිරිත් දේශනයයි. (2) මංගල සූත්‍ර පිරිත් දේශනයයි.

(3) අංගුලිමාල පිරිත් දේශනයයි. (4) මෙත්ත සූත්‍ර පිරිත් දේශනයයි.

16 පිංකම් පිළිබඳ චාරිත්‍ර වාරිත්‍ර ඉටුකිරීම පවිත්‍රව, ක්‍රමවත්ව, සංවිධානාත්මකව, දකින්නන් තුළ ශ්‍රද්ධාව උපදවමින් කටයුතු කිරීම වැනි බොහෝ දේ අපට හුරු පුරුදු වූයේ,

(1) පංසල ඇසුරු කිරීමෙනි. (2) නිවස ඇසුරු කිරීමෙනි.

(3) පාසල ඇසුරු කිරීමෙනි. (4) සමාජය ඇසුරු කිරීමෙනි.

17 මීට වසර 2600 කට ඉහත බුද්ධ, ධම්ම යන රත්න දෙක ලොව පහළ විය. සංඝ රත්නය ලොව පහළ වූයේ,

(1) වෙසක් පුන් පොහෝ දිනකය. (2) පොසොන් පුන් පොහෝ දිනකය.

(3) ඇසළ පුන් පොහෝ දිනකය. (4) දුරුතු පුන් පොහෝ දිනකය.

18 බෞද්ධයකු වීමේ පළමු පියවර වන්නේ,

(1) බුදුන් සරණ යාමයි. (2) දහම් සරණ යාමයි.

(3) සඟ සරණ යාමයි. (4) තෙරුවන් සරණ යාමයි.

19 තෙරුවන් සරණ යාම දෙවියකු, බ්‍රහ්මයකු හෝ ගැලවුම් කරුවකුගේ පිහිට පැතීමට වඩා හාත්පසින්ම වෙනස් වූවකි. එහි පදනම වන්නේ,

(1) ඇදහීමයි. (2) ශ්‍රද්ධාවයි. (3) යැදීමයි. (4) විශ්වාසයයි.

20 ''ඉතිපිසෝ'' පාඨයෙන් කෙරෙන්නේ

(1) බුද්ධ රත්නයේ ගුණ සිහිකිරීමයි. (2) ධම්ම රත්නයේ ගුණ සිහිකිරීමයි.

(3) සංඝ රත්නයේ ගුණ සිහිකිරීමයි. (4) ත්‍රිවිධ රත්නයේ ගුණ සිහිකිරීමයි.

21 බුදුන්වහන්සේ සියලු කෙළෙසුන්ගෙන් දුරුවූ හෙයින්ද, රහසින්වත් පවු නොකළ හෙයින්ද, සියලු පූජාවන් ලැබීමට සුදුසු වූ හෙයින්ද

(1) ''අරහං'' නම් වන සේක. (2) ''සම්මා සම්බුද්ධ'' නම් වන සේක.

(3) ''සුගත'' නම් වන සේක. (4) ''සත්ථා'' නම් වන සේක.

22 ලෝභ, ද්වේෂ, මෝහ යන ඒවා මුල්කරගත් පව්වූ සිතිවිලි

(1) කර්ම නම් වේ. (2) කෙළෙස් නම් වේ.

(3) චේතනා නම් වේ. (4) දුක්ඛ නම් වේ.

23 ''ස්වාක්ඛාතෝ'' යන පාඨයෙන් කියවෙන ධර්ම රත්නයේ ගුණ ගණන,

(1) හයකි. (2) නවයකි. (3) දොළහකි. (4) පහළොවකි.

24 තමා විසින්ම පිළිපැද ඇස් පනාපිට මෙළොවදීම ප්‍රතිඵල දැක ගත හැකි බැවින් ධර්ම රත්නය

(1) ''අකාලික'' නම් වේ. (2) ''ඒහි පස්සික'' නම් වේ.

(3) ''ඕපනයික'' නම් වේ. (4) ''සංදිට්ඨික'' නම් වේ.

25 සංසාරගත දුකින් එතරවීම උදෙසා බුදුරජාණන් වහන්සේ විසින් පෙන්වා දෙනුලැබූ ශ්‍රේෂ්ඨ ප්‍රතිපත්ති මාර්ගයේ ගමන් කරන ආර්ය ශ්‍රාවක පිරිස

(1) උපාසක පිරිසයි. (2) උපාසිකා පිරිසයි.

(3) මහා සංඝරත්නයයි. (4) පෘථග්ජන පිරිසයි.

26 සංඝරත්නයේ ගුණ විමසා බැලීමේ දී ''සුපටිපන්නෝ'' පාඨය ඒ සඳහා උදවු කරගත හැකිය. එම පාඨයට අනුව සංඝරත්නයේ ගුණ ගණන වන්නේ,

(1) නවයකි. (2) දහයකි. (3) එකොළහකි. (4) දොළහකි.

27 මහා සංඝරත්නය මනා වූ පිළිවෙත් පුරන නිසා

(1) ආහුණෙය්‍ය නම් වේ. (2) පාහුණෙය්‍ය නම් වේ.

(3) අංජලිකරණීය නම් වේ. (4) සුපටිපන්න නම් වේ.

28 ප්‍රධාන වශයෙන් ගිහියාට අයත් නිත්‍ය ශීලය වන පංචශීලය ආරක්ෂා කිරීමෙන්

(1) ධනය ලැබේ. (2) තනතුරු ලැබේ.

(3) නිවසේ සමගිය, සතුට රැකේ (4) ප්‍රභූත්වය ලැබේ.

29 ආර්ය සත්‍ය අවබෝධ කරගෙන සම්පූර්ණයෙන්ම දුකින් එතරවීමේ මංපෙත් විවර වනුයේ,

(1) ස්වාභාවික වස්තු සරණ යාමෙනි. (2) දෙවියන් සරණ යාමෙනි.

(3) තෙරුවන් සරණ යාමෙනි. (4) බමුණන් සරණ යාමෙනි.

30 සිත කිළිටිකරන, කුසල් සිත්වලට බාධා කරන සිතුවිලි නීවරණ නමින් හැඳින්වේ. නීවරණ ගණන,

(1) තුනකි. (2) හතරකි. (3) පහකි. (4) හයකි.

31 රත්වී උතුරන විට බුබුළු නැගෙන ජලයෙහි යමක් දැකිය නොහැකිය. එසේම සිතෙහි තරහව ඇතිවිට ද යමක් මතකයට නගාගත නොහැකිය. එය

(1) ''කාමච්ඡන්දය'' සිත තුළ ක්‍රියාත්මක අවස්ථාවයි.

(2) ''ව්‍යාපාදය'' සිත තුළ ක්‍රියාත්මක අවස්ථාවයි.

(3) ''ථීනමිද්ධය'' සිත තුළ ක්‍රියාත්මක අවස්ථාවයි.

(4) ''විචිකිච්ඡාව'' සිත තුළ ක්‍රියාත්මක අවස්ථාවයි.

32 යහපත් අරමුණක හෙවත් කුසල් අරමුණක සිත එකඟ කර ගැනීම

(1) දානයෙහි පරමාර්ථයයි. (2) සීලයෙහි පරමාර්ථයයි.

(3) භාවනාවෙහි පරමාර්ථයයි. (4) සමාධියෙහි පරමාර්ථයයි.

33 සමථ භාවනාව වැඩීමෙන් අපට ලබාගත හැකි වන්නේ,

(1) සීලයයි. (2) සමාධියයි. (3) ප්‍රඥාවයි. (4) නිවනයි.

34 ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා වාචා, සම්මා කම්මන්ත හා සම්මා ආජීව අනුව හික්මීම

(1) සමාධියයි. (2) ප්‍රඥාවයි. (3) භාවනාවයි. (4) සීලයයි.

35 හිඳීම, සිටීම, ඇවිදීම ආදී සියලු ක්‍රියාවන්හිදී අවබෝධයෙන් යුතුවීම

(1) ඉන්ද්‍රිය සංවරයයි. (2) සති සම්පජඤ්ඤයයි.

(3) සංතුට්ඨිතාවයි. (4) මේ කිසිවක් නොවේ.

36 සමථ භාවනාව වඩන පුද්ගලයා ආචාර්‍ය්‍යවරයකුගෙන් උපදෙස් ලබාගැනීමද අවශ්‍ය වේ. එහිදී තමාගේ චරිතයට අනුව කර්ම ස්ථානයක් තෝරා ගත යුතුය. එසේ තෝරාගත හැකි අරමුණු හෙවත් කර්මස්ථාන ගණන

(1) තිහකි. (2) හතලිහකි. (3) පනහකි. (4) හැටකි.

37 යම්කිසිවකු කුමන චරිතයකට අයත්දැයි දැන ගන්නේ කරුණු කිහිපයක් සලකා බැලීමෙනි. සිතන පතන ආකාරය, රුචි අරුචිකම්, ඇවතුම් පැවතුම් ආදිය අනුව විමසා බැලීමෙන් කෙනෙකු අයත් වන චරිතය තීරණය කළ හැකිය. එවැනි පුද්ගල චරිත ගණන

(1) හයකි. (2) පහකි. (3) හතරකි. (4) තුනකි.

38 මගපෙන්වීමක් නොලබා තමාගේ අභිමතය පරිදි සාර මසක් මුළුල්ලේ භාවනාකොට ප්‍රතිඵල නොලැබූ හිමිනමකි

(1) යස තෙරුන් වහන්සේ

(2) දෙව්දත් තෙරුන් වහන්සේ

(3) ආනන්ද තෙරුන් වහන්සේ

(4) සැරියුත් හිමියන්ගේ ගෝල නමක් වූ ස්වර්ණකාර හිමි

39 සිදුහත් බෝසතාණෝ ''කිං කුසල ගවේසීව'' සිටි කාලයේ දී හමුවුණු ආලාර කාලාම තවුසා

(1) උසස් ධ්‍යාන ලාභියෙකි. (2) සප්ත සමාපත්ති ලාභියෙකි.

(3) අෂ්ට සමාපත්ති ලාභියෙකි. (4) පඤ්චාභිඥා ලාභියෙකි.

40 ආපෝ, තේජෝ, වායෝ යන සතර මහා භූත ඇස හා රූප, කන හා ශබ්ද, නාසය හා ගඳ සුවඳ, දිව හා රස, සිරුර හා ස්පර්ශය යන සාධකවල එකතුව

(1) රූපස්කන්ධයයි. (2) වේදනාස්කන්ධයයි.

©Ú×_´ {ÚÆÆÈ À`ÑÍÓÚ
All Rights Reserved

**පළමු වාර පරීක්ෂණය 2015**

**10 ශ්‍රේණිය** | # බුද්ධ ධර්මය - II | **කාලය පැය 2 යි.**

නම/ විභාග අංකයඃ

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරාගත් අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ. ((1) - ලකුණු 02 (2) - ලකුණු 03 (3) - ලකුණු 05 වශයෙනි.)**

01 (1) ''ගෞතමයන් වහන්ස, ඇතුළත අවුල්ය. පිටතද අවුල්ය. සත්ව ප්‍රජාව අවුලෙන් වෙලී සිටී. කවරෙක්නම් මේ අවුල් නිරවුල් කරන්නේ ද?'' බුදුන්වහන්සේගෙන් මෙබඳු ප්‍රශ්නයක් විමසුවේ කවුද?

(2) බෞද්ධයන් වන අපගේ අවසාන අරමුණ කුමක් ද?

(3) අප සිත් සතන් තුළ ඇති රාග, ද්වේෂ, මෝහ ආදී කෙළෙස් යටපත් කිරීම සඳහා උපකාර වන භාවනාව නම් කරන්න.

(4) සසර දුකට මුල්වන රාගාදී කෙළෙස් මුල් උදුරාදමන නුවණ ලබාදෙන සංසාරගත දුකින් මිදී නිවන් දැකීමට උපකාර වන භාවනාව කුමක් ද?

(5) ලෝකය හා ජීවිතය පිළිබඳ අපට ඇතිකර ගත හැකි අවබෝධය දෙයාකාරය. ඒ දෙක ලියන්න.

(6) විපස්සනා භාවනාව හැඳින්වෙන වෙනත් නම් දෙකක් ලියන්න.

(7) වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ හිමියන්ගේ ගිහි නම කුමක් ද?

(8) වැලිවිට සරණංකර හිමි ''අසරණ සරණ සරණංකර'' යන නමින් හැඳින්වීමට හේතුව දක්වන්න.

(9) ''මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවන්නේය.'' මෙම ප්‍රකාශය කළ රජතුමා නම් කරන්න.

(10) එතුමාගේ දෙමාපියන් නම් කරන්න.

02 (1) සතර පෙරනිමිති නම් කරන්න.

(2) සිදුහත් කුමරු සතර පෙර නිමිති දැකීමෙන් අවබෝධ කරගත් දෙය පහදන්න.

(3) සිදුහත් කුමරු මුහුණ දුන් අභියෝග තුනක් දක්වා ඒවා ජයගත් ආකාරය කෙටියෙන් පහදන්න.

03 (1) ආරභථ නික්ඛමථ .......... මෙම ගාථාව සම්පූර්ණ කරන්න.

(2) එම ගාථාව ඇතුළත් සූත්‍ර ධර්මය නම් කරන්න.

(3) ඉන් කියවෙන අදහස දක්වන්න.

04 (1) බෞද්ධයෝ උපතේ සිට මරණය දක්වා සියලු සුවිශේෂී අවස්ථාවලදී සංඝරත්නයේ ආශිර්වාද ලබාගන්නා අවස්ථා දෙකක් නම් කරන්න.

(2) භික්ෂූන්වහන්සේලාගේ පැවැත්මට ගිහියා දායක විය යුතු ආකාරය දක්වන්න.

(3) සංඝරත්නයෙන් සිදුවන ආගමික, සංස්කෘතික හා ජාතික සේවාවන් තුන බැගින් වෙන වෙනම ලියන්න.

05 (1) තෙරුවන් නම් කරන්න.

(2) ''අරහං'' යන බුදු ගුණය පැහැදිලි කරන්න.

(3) ධර්ම රත්නයේ ගුණ දැක්වෙන පාඨය ලියා එහි සඳහන් දහම් කරුණු වෙන් වෙන්ව දක්වන්න.

06 (1) පංචනීවරණ වලින් දෙකක් නම් කරන්න.

(2) ඉන් එකක් උපමා මගින් පහදන්න.

(3) බුද්ධානුස්සති භාවනාව වඩන ආකාරය කෙටියෙන් පහදන්න.

07 (1) භාවනා වර්ග දෙක නම් කරන්න.

(2) ත්‍රිලක්ෂණය හඳුන්වන්න.

(3) විපස්සනා භාවනාව එනමින් හැඳින්වෙන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.